(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 1999 අංක 51 දරන කාර්මික ආරක්ෂා පදනම (ශ්‍රී ලංකා) (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 1999 දෙසැම්බර් මස 14 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී .

---

1999 දෙසැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75.        තැපැල් ගාස්තුව : රු. 3.50.

## 1999 අංක 51 දරන කාර්මික ආරක්ෂා පදනම (ශ්‍රී ලංකා) (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 14 වැනි දින.]

එල්. ඩී.–ඕ. 15/97.

### කාර්මික ආරක්ෂා පදනම (ශ්‍රී ලංකා) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"කාර්මික ආරක්ෂා පදනම (ශ්‍රී ලංකා)" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟවන ලද රීතිවලට අනුව, එකී පදනම හා සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ සහ ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා උදෙසා ද, ඒ පරමාර්ථ හා කාරණා කිහිපය එකී පදනම විසින් මෙතෙක් කල්, සාර්ථක ලෙස කරගෙන ගොස් හා ඉටුකර ඇති හෙයින් ද, ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ ඒ ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 1999 අංක 51 දරන කාර්මික ආරක්ෂා පදනම (ශ්‍රී ලංකා) (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "පදනම" යනුවෙන් හඳුන්වනු ලබන) කාර්මික ආරක්ෂා පදනමේ (ශ්‍රී ලංකා) දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසු "කාර්මික ආරක්ෂා පදනම (ශ්‍රී ලංකා)" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. කාර්මික ආරක්ෂා පදනම (ශ්‍රී ලංකා) සංස්ථාගත කිරීම.

H - 022545

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ : -

(අ) කාර්මික ආයතනවලට සහ වාණිජ ආයතනවලට ආරක්ෂාව සැපයීමේ විද්‍යාව සහ වෘත්තීය පරිචය ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට දායකත්වය දීම ;

(ආ) වෘත්තියේ සියලුම සාමාජිකයන් අතර වඩා සමීපස්ථ සම්බන්ධීකරණයක් ඇති කිරීමෙන් කාර්මික සහ වාණිජ ආයතනවල ආරක්ෂක කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ වඩා කාර්යක්ෂම කිරීම ;

(ඇ) අදහස් උදහස්, දැනීම සහ පළපුරුද්ද, හුවමාරු කර ගැනීම පහසුකරලීම පිණිස සමාන පරමාර්ථ ඇති වෙනත් මණ්ඩල සමග අනුබද්ධවීම සහ සම්බන්ධවීම ;

(ඈ) සංස්ථාවේ සාමාජිකයන්ගේ කාර්යය සහ චර්යාව සම්බන්ධයෙන් ආචාර ධර්ම සහ වෘත්තීය ප්‍රමිති ඇති කිරීමෙහි ලා දායකත්වය දීම සහ ඒවා පෝෂණය කිරීම සහ එහි ප්‍රවර්ධනය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම ;

(ඉ) ආරක්ෂක සේවා වෘත්තියේ අර්ථසාධනය සහ වැඩි දියුණුව සඳහා තොරතුරු, අදහස් උදහස්, ක්‍රම සහ ශිල්පීය ක්‍රම එකතු කිරීම, සංසන්දනය කිරීම සහ බෙදා හැරීම ;

(ඊ) ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් වූ කාරණා සහ ගැටළු පිළිබඳ සාකච්ඡා, අධ්‍යයන හා පර්යේෂණ පෝෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ඒවාට දායකත්වය දීම සහ පහසුකම් සැලසීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ

සේවයෙන් නෙරපීම ද ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව නිලධරයන් සහ ඒ රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වූ විධායක කමිටුවක් විසින්, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ පදනමේ විධායක කමිටුව, සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සම්බන්ධයෙන් ද, නිලධරයන් සහ විධායක කමිටුව තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් ද, විධායක කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්යය ඉටු කිරීම සම්බන්ධයෙන් සහ සංස්ථාවේ සහ විධායක කමිටුවේ රැස්වීම්වල කටයුතු කර ගෙන යාමේ කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාව විසින්, කලින් කල, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) එකී රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී, එවැනි ම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි වන්නේ ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ බලපැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත, නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සළකනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**7**. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

පදනමේ ණය ආදිය.

**8**. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවැති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**9**. විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී තැනැත්තන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**10**. (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි අදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**11**. සංස්ථාව විසුරුවා හරින ලද විටක, සංස්ථාවේ සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර වුව ද, දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය ආදායම හෝ දේපළ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදාදීම එහි රීති මගින් තහනම් කොට ඇත්තා වූ ද, වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේදැයි, සංස්ථාවේ සාමාජිකයන් විසින්, සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.